රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 335

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1986 ජුලි මස 22 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ආයතන සංග්‍රහයට සංශෝධන

1. <u>අන්තිමවරට ලත් වැටුප - VII වැනි පරිච්ඡේදය:</u>

(අ) 4 වැනි ඡේදයට පහත සඳහන් වගන්තිය එකතු කරන්න.
"4:9 "අන්තිමවරට ලත් වැටුප" යනුවෙන් අදහස් කරනුයේ, වැටුප් ප්‍රතිශෝධනය ක්‍රියාත්මක වන දිනට පූර්වාසන්න දිනයේ නිලධාරියා ලබාගත් වැටුප මිස, වැටුප් ප්‍රතිශෝධනය නිවේදනය කරන අවස්ථාවේදී ලබාගත් වැටුප නොවේ."

(ආ) 5 වැනි ඡේදයට පහත සඳහන් වගන්තිය එකතු කරන්න.
"5:11 "අන්තිමවරට ලත් වැටුප" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම ක්‍රියාත්මක වීමේ දිනට පූර්වාසන්න දිනයේ නිලධාරියා ලබාගත් වැටුප මිස, උසස්වීම නිවේදනය කරන අවස්ථාවේදී ලබාගත් වැටුප නොවේ."

2. <u>විවේක නිවාඩු - XII වන පරිච්ඡේදය:</u>

8:1 - වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න.

"8:1 - නිලධාරියෙකුට එක් එක් අවුරුද්දක් සඳහා උපරිම වශයෙන් දින 24 ක විවේක නිවාඩු දීමට පුළුවන. සතියේ දින හතක් වැඩ කිරීම නියම වී ඇති නිලධාරීන් (උදා: වෛද්‍ය නිලධාරීන්, හෙදියන්, පොලිස් නිලධාරීන් බන්ධනාගාර නිලධාරීන් ආදීන්) සම්බන්ධයෙන් එම උපරිමය දින 28 ක් විය යුතුය.

Siriwardhana
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ර/22.